ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

11

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 11.11.2024 |

K. පුවනේන්දිරා මයා
අංක: 15, අත්තියඩි වීදිය,
යාපනය,
කෝප්පායි.

(පැමිණිලිකරු)

විපුලන් මයා
ගුරුවරයා
යා/ යාපනය හින්දු විද්‍යාලය

සසිදරන් මයා
ගුරුවරයා
යා/ යාපනය හින්දු විද්‍යාලය

විදුහල්පති
යා/ යාපනය හින්දු විද්‍යාලය

(වගඋත්තරකරුවන්)

**පැමිණිලි අංකය: HRC-JA-238-2022**

**පැමිණිල්ල:**

පුවනේන්දිරා ඉලක්කියන්, වයස - 15, පාසල් ශිෂ්‍ය, යාපනය හින්දු විද්‍යාලය, ලිපිනය: අංක 15, අත්තියඩි වීදිය, යාපනය. යන ශිෂ්‍යයා පසුගිය 23.11.2022 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය කාර්යාලයේදී කළ වාචික ප්‍රකාශය, “උදේ 10.50 ට පමණ යාපනය හින්දු විද්‍යාලීය ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කරමින් සිටින විට මගේ පන්තියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු වන කිරුජන් යන අය පැමිණ විපුලන් සර් එක්කරගෙන එන්න කියමින් මා කැඳවාගෙන ගියේය. මම ද ඔහු සමඟ අපගේ පන්තිය වන 10A පන්ති කාමරයට ගියෙමි. එහිදී විපුලන් ගුරුවරයා, අංශ ප්‍රධානියා සසිදරන් ගුරුවරයා සහ ඒ වගේම මගේ පන්තියේ ඉගෙනුම ලබන සිසුන් පස් දෙනෙකු ද සිටියහ. මම එතැනට ගිය විට විපුලන් සර්, යශෝදරන් යන මාගේ යාළුවට රුපියල් 50 ක් දුන්නා ද? යනුවෙන් මාගෙන් ඇසුවේය. මම ඔව් කිව්වා. එයට ඔහු මාගෙන්, නුඹ කොහොමද ඔහුට රුපියල් 50 ක් දෙන්නෙ? ඔහු හිඟන්නෙක් ද? කියලා මගෙන් ඇහුවා. එසේ අසමින් මගේ ඔළුව අල්ලලා මගේ පිටට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

ගැහුවා. ඔහු මගේ පන්තියේ මිතුරෙකුට ලීයක් ගෙන එන ලෙස ඉල්ලා සිටියේ ය. සිසුවා ලීයක් ගෙන ආ පසු කකුල් සහ අත් වලට 4 වතාවක් ගැහුවා. එම ලීය කැඩී ගිය විට ඔහු කැඩුණු ලීයෙන් ද පහර දුන්නේ ය. පසුව ඔහු පන්තියේ සිට අතින් ඇදගෙන ගොස් ඔහුට පහර දි දී පන්ති කාමරයෙන් පිටතට ගෙන ගොස් මාගේ හිසට අතින් පහර දුන්නේය. sectional head සසිදරන් මේ සියල්ල දෙස බලා සිටියේය. ඔහු මට සහ මම රුපියල් 50 ක් ලබා දුන් යසෝදරන්ට ලිපියක් ලියා දෙන ලෙස වයිරවර් කෝවිලේ දී ඉල්ලා සිටියේය. ඔහු මට සිදුවූ සිද්ධිය ලියන්න කිව්වා. මම ලිපියක් ලිව්වා. පසුව ලිපිනය ලියා නැති බව පවසමින් නැවතත් ලියුමක් ලියන්න කියලා කිව්වා. මම මාගේ ලිපියේ, මමයි මගේ යාළුවයි සෙල්ලම් කර කර ඉන්නකොට මගේ යාළුවාගේ යාළුවෙක් වන ඩිලෝජන් අයියා (11 වසර ශිෂ්‍යයෙක්) මගේ යාළුවාගේ බෑග් එකෙන් රුපියල් 50 ක් අරගෙන ගිය බවත්, මාගේ යාළුවා එපා කියද්දී ඔහු (ඩිලෝජන්) ඇහුවේ නෑ කියලත්, එය බස් ගාස්තු කියලා මගේ යාළුවා කීව නිසා මම මගේ ළඟ තිබුණු රුපියල් 50 එයාට දුන්නා යනුවෙන් ලිව්වා. ලියුම ලස්සන නෑ කියමින් 4 වතාවක් නැවත නැවත ලිපිය ලියන්න කිව්වා. යාදවන් යන මාගේ පන්තියේ යාළුවෙක් මම ලිපිය ලියනකොට විදුහල්පතිතුමාට ගුරුවරයා මට ගහනවා කියලා ගිහින් මට කිව්වා. ඒකට විදුහල්පතිතුමා, ප්‍රශ්නය ගැන හොයලා බලන්න කියලා sectional head ට කියන්නම් කියලා කියල තියෙනවා. මම ලියුම ලියමින් සිටින විට විදුහල්පතිතුමා එතනින් ගියා. ඒත් මාගෙන් කිසිම දෙයක් ඇසුවේ නෑ. ඒ සමගම අම්මටයි තාත්තටයි එන්න කියලා ඔවුන් ඉදිරියේ මා හට අගෞරව කරන බවත්, leaving certificate එක දෙන බවත් කිව්වා. ඔහු ගිය පසු sectional head සසිදරන් සර්, මෙම කාරණය ඕනැවට වඩා හිතන්න එපා කියලා කීවා. ඔහු බැන වදිමින් සිටි අවස්ථාවේ මම ඔහුගේ දෙපා ළඟ වැඳ වැටිලා ඇඩුවා. ගෙදර ආ පසු මා දෙස බලා තාත්තා ඇහුවම මම ඔහුට කාරණය කිව්වා. තාත්තා විදුහල්පතිතුමාට දන්වලා 2022.11.18 ප.ව.3.15 ට පමණ යාපනය ශික්ෂණ රෝහලට ඇතුලත් කලා. 2022.11.19 දින පැය 8.45 ට රෝහලෙන් පිටත් කලා. මා හට පහර දෙන අවස්ථාවේ බලා ගෙන සිටි සිසුන්ගේ නම් - සෝම විදාන්, යාදවන්, කිරුජන්, ආර්තිකන්, යසෝධන්.

<u>පළවෙනි වගඋත්තරකරු වන විපුලන් මයා (ගුරුවරයා)</u>

පසුගිය 2022.11.18 සිකුරාදා පාසලේ විවේක කාලයේදී මම විදුහල්පති කාර්යාලයෙන් පිටතට පැමිණෙන විට 10 වැනි ශ්‍රේණියේ අංශ ප්‍රධානී සසිදරන් යන අය 10 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන යසෝදන් නමැති සිසුවා පෙන්වා, ඔබේ අංශයේ ඉගෙනුම ලබන සිසුවෙක් මුදලක් සොරකම් කලා යැයි පැවසුවේය. එවිට මම යසෝදරන්ගෙන් කොහේදීද සොරකම් කළේ යැයි විමසූ විට, ඔහු කැන්ටිම ළඟ යනුවෙන් පැවසුවේය. කවුද සොරකම් කලේ යනුවෙන් ඇසූ විට 11 පන්තියේ ඩිරෝජන් යනුවෙන් පවසන ලදී. සල්ලි කීයද කියලා ඇහුවම රුපියල් 50 ක් කියලා කිව්වා. ඒ වෙලාවේ 10 බී ශ්‍රේණියේ අංශ ප්‍රධානියාත් එතන හිටියා. ඊට පස්සේ මම යසෝදරන්ව එයාගේ පන්තියේ ඇරලවමින් මම 11 පන්තියේ ඉගෙනුම ලබන ඩිරෝජන් දිහා බලලා "ඇයි ඔයා සල්ලි හොරකම් කළේ" කියලා ඇහුවා. "මම 10බී එකේ ඉගෙන ගන්නා යසෝදරන් අඳුරනවා. මම

එයාගෙන් සල්ලි ඉල්ලුවා" යනුවෙන් ඩිරෝජන් කිව්වා. ණයක් වශයෙන් ඉල්ලුවා කිව්වා. ඒකට මම කිව්වා "ඔයා බොරු කියන්නේ. කැන්ටිමට ගිය යශෝදරන්ගේ සල්ලි එයාගේ අවසරයකින් තොරව හොරකම් කරලා" කියලා කිව්වා. ඒ වෙලාවේ 11 පන්තියේ තවත් ළමයි කීපදෙනෙක් ද සිටියහ. ඊට පස්සේ මම ඩිරෝජන්ට කිව්වා, "ඔයා හිඟා කන්නේ මොකටද? එහෙම කරනවානම් ඒක ඔයාගේ පන්තියේ දී ගන්න. ඇයි ඔයා පහළ පන්තියෙන් ගන්නේ?" යනුවෙන් එම ශිෂ්‍යයාට දොස් කීවෙමි. ඒ සල්ලි ගත්ත කෙනාට වහාම දෙන්න කියලා කිව්වා. වහාම සල්ලි ලබා දෙන බව පවසමින් ඩිරෝජන් ගියේය. ඊට පස්සේ මම ඩිරෝජන් ලබා ගත් මුදල යසෝදන්ට දුන්නද කියලා බලන්න 10 බී පන්තියට ගියෙමි. මම යසෝදන්ගෙන් ඇහුවා සල්ලි දුන්නද කියලා. එයට යසෝදන්, " මුදල දුන්නේ නෑ. ළඟ ඇති 10 පන්තියට ඩිරෝජන් ගියා" යනුවෙන් පැවසුවේය. මම වහාම යසෝධන්ව කැඳවාගෙන 10 පන්තියට ගියෙමි. එතන ශිෂ්‍යයෝ ටික දෙනෙක් සිටියහ. එහි එක් සිසුවෙක් රු. 50 මුදල ළඟ තබාගෙන සිටියේය. එම ශිෂ්‍යයා මේ සිද්ධියට සම්බන්ධ නැති අයෙකි. මම ඇහුවා "ඇයි ඔයා මේ මුදල තියාගෙන ඉන්නේ" කියලා. එයට එම ශිෂ්‍යයා කිව්වා "11බී එකේ ඩිරෝජන් අයියා ළඟ පන්තියට දෙන්න කිව්වා" කියලා සිසුවා පැවසීය. ඒ අවස්ථාවේ මම එම ශිෂ්‍යයා වෙත "මුදල ඩිරෝජන්ට නැවත ලබා දී, මෙම මුදල යසෝදන්ට දෙන්න කියන්න" කියලා කිව්වා. වහාම එම සිසුවා ඩිරෝජන් සොයා ගියේය. එය 5 වන කාල පරිච්ඡේදයයි. එවිට මම යසෝදන්ගෙන් ඇහුවා ඇයි ඔයාට දෙන්න ඕන මුදල 10 බී පන්තියට දුන්නේ? යනුවෙන් ඇසුවෙමි. එවිට යසෝධන් කීවේ, මෙයට 10 පන්තියේ ඉලක්කියන් සම්බන්ධයි. ඉලක්කියන් මාගේ අත පිටු පසින් අල්ලා ගෙන සිටියදී ඩිරෝජන් pocket එකෙන් මුදල ගත්තේය" යනුවෙන් පැවසුවේය. ඒ අවස්ථාවේ තමයි මම ඉලක්කියන් යන අය ඩිරෝජන් මුදල ගැනීමට උදව් කර ඇති බව දැනගත්තේ. ඒ වන තෙක් ඉලක්කියන් මෙම සිද්ධියට සම්බන්ධයැයි මා දැන නොසිටියෙමි. ඒ අවස්ථාවේ මම ඉලක්කියන් කෝ යනුවෙන් ඇසූ විට සිසුන් ඔහු ground එකේ යනුවෙන් පැවසූහ. වහාම ඔහු රැගෙන එන ලෙස පැවසූ විට සිසුන් ඔහු රැගෙන ආවා. වහාම මම ඔහු 10 පන්තියට රැගෙන ගොස්, මම ඔයා කෙරෙහි හොඳ ආකල්පයෙන් හිටියා. ඇයි ඔබ ඩිරෝජන් සමඟ සම්බන්ධතා තියාගන්නේ යනුවෙන් ඇසුවෙමි. ඩිරෝජන් නුසුදුසු ක්‍රියාකාරකම්වල නිරතවූ අයෙකු නිසා නිරීක්ෂණයට භාජනය කර ඇති සිසුවෙක් නේද යනුවෙන් පැවසුවෙමි. එවිට ඉලක්කියන්ගෙන් යසෝදරන් බසයේ යාම සඳහා මුදල් ඉල්ලු බව පැවසුවා. යසෝදරන් කියනවා, ඔහු රැගෙන යාමට ඔහුගේ අම්මා එනවා කියලා. ඔහු බසයෙන් ආවේ නෑ කියනවා. පසුව මම ඉලක්කියන්ගෙන්, නුඹ සම්පූර්ණයෙන්ම බොරු කියන්නේ. ඇත්ත කියන්න කිව්වා. ඇත්ත දැනගන්න ඕන නිසා පන්තියට එළියේ තිබූ ලීයකින් ගැසුවෙමි. එය ඉලක්කියන්ගේ පිටු පස වැදුනි. පසුව ඔහුගෙන් ඇත්ත කියන්න. නැත්නම් ඔබේ දෙමව්පියන්ට කියනවා යනුවෙන් පැවසුවෙමි. මුදල ගැනීමට නුඹ සහය ලබා දී ඇති බවත්, ඩිරෝජන් සමඟ ඇති සම්බන්ධතා ගැන දෙමව්පියන්ට කියනවා යනුවෙන් පැවසුවෙමි. පසුව ඉලක්කියන් වැරැද්ද පිළිගෙන "සමාවෙන්න සර්. මම යසෝදරන්ගේ අත අල්ලාගෙන සිටින විට ඩිරෝජන් යසෝදරන්ගේ මුදල් ගත්තා" යනුවෙන් ඇත්ත පිළිගත්තේය. මම ඔහුට එක් වතාවක් පමණක් ගැසුවෙමි. එය ද මේසයේ

වැදී ඔහුට වැදුනේ. පසුව මම සිදුවූ සියළු දේ ලිපියක් වශයෙන් ලියා දිය යුතු බවත් පාසලේ ඇති වයිරවර් කෝවිලේ එම ලිපිය ලියන ලෙසත් පවසමින් මම විනය කමිටු රැස්වීමට ගියෙමි. රැස්වීම නිමවී මා පැමිණෙන විට දෙදෙනාම කොවිලේ ලිපිය සමඟ සිටියහ. යසෝදරන් ලිපිය නිවැරැදි ලෙස ලියා තිබුණි. ඉලක්කියන් ලිපිනය, දිනය නොදමා ලිපිය ලියා තිබුණි. වහාම මම ලිපිනය, දිනය දමා නිවැරැදි ලෙස ලිපිය ලියන ලෙස ඔහුට පැවසුවෙමි. පසුව ඉලක්කියන් දෙවන ලිපිය ලීවේය. එම ලිපියේ ටික වේලාවකින් මුදල ලබා දුන්නෙමි යනුවෙන් බොරු ලියා තිබුණි. නුඹ ඇයි බොරු කියන්නේ යනුවෙන් මම ඔහුගෙන් විමසමින් තෙවෙනි වතාවටත් ලිපිය ලියන්න කිව්වා. පසුව තෙවෙනි වතාවේ නිවැරැදි ලෙස සමාව අයැදිමින් මින් ඉදිරියට මෙසේ වැරැදි නොකරන බව පවසමින් ලිපිය ලියා ඇත. පසුව ඉලක්කියන් මාගේ කකුල් අල්ලා වැඳ මින් ඉදිරියට වැරැදි නොකරන බව සමාව අයැද සිටියේය. එවිට මම ඔහුට, "නුඹ හොඳ දරුවෙක්. නමුත් නිරීක්ෂණයට භාජනය වී ඇති ඩිරෝජන් සමඟ ඇයි මෙවැනි සම්බන්ධතා පවත්වන්නේ. මේ බව මම නුඹේ දෙමව්පියන්ට කියනවා" යනුවෙන් පැවසුවෙමි. ඒ අවස්ථාවේ ඔහු අඬමින් සිටියේය. මේ බව මම නුඹේ දෙමව්පියන්ට කියනවා යනුවෙන් පැවසීමෙන් පසුව ඔහුව පන්තියට යැවුවෙමි. අදාල එම සිසුවාට දඬුවම් කලයුතුයි යන අදහස මා තුල නොතිබුණි. මෙසේ මුදල් ගැනීම වැරැදි මාර්ගයට ඔහු රැගෙන යාම වැළැක්වියයුතුයි යන අරමුණ ඇතිවයි මා මෙසේ තරවටු කලේ. පසුව මම 10 ශ්‍රේණියේ අංශ භාර ගුරුවරයා සමඟ කතා කර අදාල මුදල එම සිසුවාට ලැබුණු බව සහතික කර ගත්තෙමි. මෙම දරුවන් තිදෙනාගේ දෙමව්පියන් කැඳවා මෙම සිද්ධිය පිළිබඳව පැහැදිලි කල යුතු බව අපි දෙදෙනා තීරණය කර ගත්තෙමු. පසුව මම අපේ පාසලේ බර ඉසිලීමේ පුහුණුකරුගේ අවමංගල උත්සවයට සහභාගිවීම සඳහා පාසල නිමවීමෙන් පසුව ගියෙමි. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිසු දරුවන්ගේ ක්‍රියාකලාපය කෙරෙහි අවධානය යොමු කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව මම විනය කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සිසුවාගේ ශාරීරික හා මානසික යහපත සහ පාසලේ ගරුත්වය ආරක්ෂා වන පරිදි සිසුන්ගේ ක්‍රියාකලාපය ගැන විමසිල්ලෙන් සිටිමින් වැරැදි මාර්ගවල ඔවුන් යොමු වීම වැළැක්වීමට කටයුතු කර එම සිසුවාගේ අනාගත යහපත උදෙසා ඔහු යහ මඟට ගැනීමට උත්සහ කළ බව මෙයින් දන්වා සිටිමි.

<u>දෙවන වගඋත්තරකරු වන කේ. සසිදරන් මයා (අංශ ප්‍රධානි)</u>

18.11.2022 දින සිකුරාදා පෙ.ව. 10.55ට පමණ 10B පන්තියේ යසෝදරන් යන සිසුවා 11 පන්තියේ සිසුවෙකු තමන්ගේ මුදල උදුරා ගත් බව විදුහල්පති කාර්යාලයේ ඉදිරිපිට මා හට පැවසුවේය. මා ඔහු ද කැටුව 11 පන්ති භාර sectional head විපුලන් මහතා වෙත බාර දී කරුණ පැවසුවෙමි. පසුව 10A පන්තියට PT විෂය නිසාත් එම විෂය මා හට පැවරී ඇති නිසාත් එම දරුවන් ක්‍රීඩා පිටියට රැගෙන ගියෙමි. එම පන්තියේ පන්ති නායක, ටික දෙනෙක් ක්‍රීඩා පිටියට එන්නේ නැතුව ඉන්න බව මා හට පැවසුවේය. එම අය ද කැඳවාගෙන ඒමට මම පන්තියට ගිය අවස්ථාවේ විපුලන් මහතා කුඩා කෝටුවක් රැගෙන පන්තියට ඇතුළුවන බව දුටුවෙමි. ඒ අවස්ථාවේ පහර දෙන ශබ්දය ඇසුණි. මා පන්තියේ ඇතුලේ නොසිටි නිසා පහර දීම නොදුටුවෙමි. නමුත් ශබ්දය පමණක් ඇසුණි. මා පන්තියට

ඇතුළුවීමට පෙර විපුලන් මහතා ඉල්ක්කියන් යන සිසුවා කැටුව එළියට පැමිණීම දුටු මම මොකක්ද? යනුවෙන් විමසුවෙමි. එයට ඔහු ඉලක්කියන් යන සිසුවා යසෝදරන් යන සිසුවාගේ අත් දෙක පිටුපසින් අල්ලා ගෙන තිබියදී 11 වසරේ සිසුවෙක් මුදල ගෙන ඇති බව පැවසුවේය. පසුව ඔවුන් සිසුන්ගෙන් සිදුවූ දේ සියල්ල ලිපියක ලියා දෙන ලෙස පවසා ඇත. පසුව මම එම ස්ථානයෙන් ගියෙමි. පාසැල නිමවී මම නිවසට ගිය පසු ප.ව. 4.00 ට පමණ විපුලන් ගුරුවරයා විසින් ඉලක්කියන් සිසුවාගේ පියා විදුහල්පතිට කතා කල බවත්, විදුහල්පති කිසිදු පියවරක් නොගත් නිසා තමන් දරුවා රෝහලට රැගෙන යන බවත් බවත්, 10 A පන්ති භාර ගරුවරයා මයුරන් පැවසු බව කිවේය. මම විදුහල්පතිගෙන් විමසූ විට සිද්ධිය පිළිබඳව තමන් දැනුවත් බවත්, ඔහු කතා කරන බවත් පැවසුවේය. පසු දින එනම්, 19.11.2022 වන දින දහවල් 12.00 ට පමණ මම සහ උප විදුහල්පති රෝහලට ගොස් සිසුවා බැලුවෙමු. තව ද සිද්ධිය සිදුවූ දිනයේ ඉලක්කියන් බියට පත්වී තිබූ නිසා මම ඔහුගෙන් කිසිවක් විමසුවේ නෑ. එහෙත් ඔයා විහිළුවට කළ දේ ප්‍රශ්නයක් වීමට ඉඩ ඇති බව පවසා හිත සනසා, බය වෙන්න එපා මම ඉන්නවා කියා ඉලක්කියන්ව පිටත් කළෙමි.

<u>තෙවන වගඋත්තරකරු වන විදුහල්පති, යා / යාපනය හින්දු විද්‍යාලය</u>

විදුහල්පතිගේ වාර්තාවේ 18.11.2022 දින සිකුරාදා විවේක වේලාවේ සිසුන් ආපන ශාලාවට ගිය බවත්, ඒ අවස්ථාවේ 10 B පන්තියේ සිසුවා යසෝදරන් 10 A පන්තියේ සිසුවා පුවනේන්දිරන් ඉලක්කියන් 10B පන්තියේ සිසුවා මිදුනන් යන අය පාසලේ ආපන ශාලාවට ගිය බවත් 10B පන්තියේ සිසුවා වන යසෝදරන් යන අයගේ අත 10 A පන්තියේ සිසුවා වන ඉලක්කියන් අල්ලාගත් අතර 11 B පන්තියේ සිසුවා වන ඩිරෝජන් යසෝදරන්ගේ කලිසමේ සාක්කුවෙන් රු. පනහක මුදලක් ලබා ගත් බවත් එම මුදල යසෝදරන් සිසුවා ඉල්ලා සිටි බවත් ඩිරෝජන් එම මුදල දීම ප්‍රතික්ෂේප කල බවත් මෙම සිද්ධිය 10 ශ්‍රේණියේ අංශ ප්‍රධානි සසිදරන් මහතාට පැමිණිලි කල බවත් සසිදරන් මහතා මෙම සිද්ධිය 11 ශ්‍රේණියේ අංශ ප්‍රධානි විපුලන් මහතාට පැමිණිලි කල බවත් ඒ අනුව විපුලන් මහතා 11 B ශ්‍රේණියේ සිසුවා කැඳවා අවවාද කර එම මුදල ලබා දෙන ලෙස පවසා ඇත. මුදල ආපසු ගෙවා ඇත්දැයි සහතික කර ගැනීම සඳහා 10 ශ්‍රේණියට ගිය බවත් මෙම සිද්ධියට 10 A ශ්‍රේණියේ සිසුවෙකු වන ඉලක්කියන් යන අය ද සම්බන්ධවී ඇති බව දැන ගැනීමෙන් අනතුරුව ඔහු කැඳවා විමසූ බවත්, ඒ අවස්ථාවේ දී ඉලක්කියන් එය බස් ගාස්තු බව බොරු පැවසූ බවත්, එම නිසා ඔහුගේ විනය යහපත් කිරීමටත්, අවවාද කිරීමටත් කුඩා කෝටුවකින් තුවාල සිදු නොවන ආකාරයට දඬුවම් කල බවත්, සිදුවූ සිද්ධිය ලිඛිතව ලියා දෙන ලෙස දැන්වූ බවත්, සඳුදා දෙමව්පියන් කැඳවා පැහැදිලි කිරීමට තීරණය කල බවත් පසුව අංශ ප්‍රධානියා අවමංගල උත්සවයකට ගිය බවත් සඳහන් කර ඇත.

තවද, මෙම සිද්ධිය පිළිබඳව මේවනතුරු තමන්ට ලිඛිත පැමිණිල්ලක් කිසිවක් සිසුන් හෝ දෙමව්පියන් මගින් නොලැබූ බවත් පැවසීය. තවද, මෙම වකවානුවේ සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ කටයුතුවල ගුරුවරුන් නිරතව ඇති නිසා විපුලන් මහතා 11 ශ්‍රේණියේ අංශ ප්‍රධානියා ලෙසත් විනය

කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන නිසාත් පසුගිය වකවානුවේ තමන්ගේ රාජකාරිය ක්‍රියාකාරීව ඉටුකර ඇති බවත්, නමුත් මෙම සිද්ධියේ දී ශාරීරික වශයෙන් දඬුවම් කිරීම නීතියට පටහැනි බවත්, සිසුන්ගේ යහපතට පටහැනි බව හඳුනාගෙන ඇති බවත් පැවසීය. තවද, එම සිසුවාට පහර දීමෙන් අනතුරුව අදාල ඉලක්කියන් යන සිසුවා තමන්ගේ පන්තියේ වෙනත් සිසුන් සමග පිට්ටනියට ගොස් සෙල්ලම් කර ඇති බවත්, ඊළඟ සඳුදා දින පාසැලට පැමිණ සාමාන්‍යයෙන් ඉගෙනුම් ක්‍රියාකාරකම්වල නිරතවවී ඇති බවත් පැවසීය. අංශ භාර ප්‍රධානීන් දෙදෙනා පාසැල් මට්ටමේ පරීක්ෂණයට භාජනය කිරීම සඳහා පාසැල් මට්ටමේ කමිටුවක් පත්කර පරීක්ෂණයක් සිදුකර ඇති බවත්, ඒ අනුව අදාල අංශ භාර ප්‍රධානියාට කිසිම හේතුවක් මත ශාරීරික වශයෙන් දඬුවම් නොකල යුතු බවට අවවාද කල බවත්, අදාල සිද්ධිය පිළිබඳව අධිකරණ කටයුතු සිදුවන නිසා අගතියටපත් සිසුවාගෙන් කිසිදු අවස්ථාවක සෘජුව විමසීමක් නොකල බවත්, අධිකරණ කටයුතු නිමවූ පසු ඒ අනුව මෙම සිද්ධිය පිළිබඳව කටුයුතු සිදු කිරීමට නියමිත බවත් තම වාර්තාවෙන් දන්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අය යාපනය හින්දු විද්‍යාලයේ ශිෂ්‍යයෙකු වූ බවත්, 2022.11.18 වන දින විද්‍යාලයේදී මුදල් සොරකමක් සම්බන්ධව ගැටලුවක් මතුවී ඇති බවත් නිරීක්ෂණය වේ. එම සොරකම සඳහා පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අය ද සම්බන්ධ බවට 1 වන වගඋත්තරකරු වන යාපනය හින්දු විද්‍යාලයේ 11 ශ්‍රේණිය භාර අංශ ප්‍රධානී වන විපුලන් මහතා හට වෙනත් සිසුවකුගෙන් ලද තොරතුරක් මත විපුලන් මහතා විසින් ඒ පිළිබඳව පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයගෙන් විමසීමක් කර ඇති බවත්, ඉන්පසුව විපුලන් මහතා විසින් ඔහුහට පහරදීමක් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එහිදී පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයට 1 වගඋත්තරකරු විසින් ලීයකින් පහරදීමක් සිදු කළ බව පැමිණිල්ලෙහි සඳහන් වන අතර, 1 වන වගඋත්තරකරු විසින් ද තමා විසින් පුවනේන්දිරන් ඉලක්කියන් යන ශිෂ්‍යයා හට ලීයකින් පහරදීමක් සිදු කළ බවත්, එය එකී ශිෂ්‍යයාගේ පිටුපසට වැදුණු බවත් ප්‍රකාශ කර ඇති බැවින් පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයට 1 වන වගඋත්තරකරු වන විපුලන් මහතා විසින් පහරදීමක් සිදු කර ඇති බව තහවුරු වේ.

පැමිණිලිකරු විසින් සිය පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයට 1 වන වගඋත්තරකරු විසින් සිදු කළ පහරදීම සම්බන්ධයෙන් දැනුවත් වීමෙන් අනතුරුව පුත්‍රයාව 2022.11.18 වන දින ප.ව. 3.15ට පමණ යාපනය ශික්ෂණ රෝහල වෙත ඇතුළත් කර ඇති බවත්, 2022.11.19 වන දින පෙ.ව. 8.45 දක්වා ඔහු රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබා ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

පුවනේන්දිරා ඉලක්කියන් යන අය වෙත 2022.11.18 වන දින යාපනය ශික්ෂණ රෝහල වෙතින් නිකුත් කරන අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පහත සඳහන් බරපල නොවන තුවාල තිබූ බව දක්වා ඇත.

1. Swelling of the right side forehead
2. Tenderness on the left side back of the upper arm

ඉහත අංක 1 සහ 2 ලෙස සටහන් කර ඇති තුවාල මොට ආයුධයකින් ඇතිවූ තුවාල බවත්, මෙම පහරදීමේ සිදුවීමට මුහුණදීම හේතුවෙන් පුවනේන්දිරන් ඉලක්කියන් යන අය හට මානසික වශයෙන් බලපෑම් සිදුව ඇති බවත්, අධිකරණ වෛද්‍ය වාර්තාව තුළ අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර තිබෙන බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරාන් ඉලක්කියන් යන අය මෙම සිදුවීම සිදුවන කාලසීමාවේදී යාපනයේ හින්දු විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබා ඇත. ඔහුහට 1 වන වගඋත්තරකරු වන විපුලන් මහතා විසින් අදාළ පහරදීම සිදු කර ඇත්තේ 10 ශ්‍රේණියේ පන්ති කාමරයක් තුළය. එම පන්ති කාමරය දෙසින් පහර දෙන ශබ්දයක් ඇසුණද ඒ පිළිබඳව නිසි මැදිහත්වීමක් 2 වන වගඋත්තරකරු වන 10 වන ශ්‍රේණියේ අංශ ප්‍රධානී වන කේ. සසිදරන් මහතා විසින් සිදු කර නොමැති බව පැමිණිලිකාර පාර්ශවයේ සහ 2 වන වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශ තුළින් නිරීක්ෂණය වේ.

තවද, 3 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා අදාළ සිදුවීම සිදුවූ අවස්ථාවේදී එම ස්ථානය අසලින් ගමන් කළ බවත්, එම අවස්ථාවේදී එක් ශිෂ්‍යයෙකු විසින් පැමිණිලිකරුගේ පුත්‍රයා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයට 1 වන වගඋත්තරකරු වන විපුලන් මහතා විසින් පහරදෙන බවට පවසා ඇති බවත් පැමිණිල්ල තුළින් සඳහන් කර ඇත. එහෙත් 3 වන වගඋත්තරකරු විසින් එම අවස්ථාවේදී ඒ පිළිබඳව සොයාබැලීමක් සිදු කර නොමැති බව පෙනී යයි. පසුව 3 වන වගඋත්තරකරු විසින් අංශ භාර ප්‍රධානීන් දෙදෙනා පාසල් මට්ටමේ පරීක්ෂණයකට භාජනය කිරීම සඳහා කමිටුවක් පත් කර පරීක්ෂණයකට භාජනය කර ඇති බවත්, ඒ අනුව අදාල අංශ භාර ප්‍රධානියාට කිසිම හේතුවක් මත ශාරීරික වශයෙන් ශිෂ්‍යයින් හට දඬුවම් නොකළ යුතු බවට අවවාද කර ඇති බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සළකා බැලීමේදී 1 වන වගඋත්තරකරු විසින් අගතියට පත් සිසුවා වන පුවනේන්දිරන් ඉලක්කියන් යන අයට පහරදීමක් සිදු කළ බවට පිළිගෙන ඇති බැවින් සහ අධිකරණ වෛද්‍ය වාර්තාව තුළින් ද ඉහත කී පුවනේනිදිරන් ඉලක්කියන් යන අය මෙම සිදුවීම හේතුවෙන් ශාරීරිකව සහ මානසිකව වධහිංසාවකට ලක්ව ඇති බවට තහවුරු වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත කොට ඇති කිසිදු තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත

සැළකිල්ලකට නැතහොත් දඬුවමකට ලක් නොකළ යුතුය යන පැමිණිලිකරුගේ දරුවා වන ඉහත කී පුවනේන්දිරන් ඉලක්කියන් යන අයගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 2 වගඋත්තරකරු වන කේ. සසිදරන් මහතා සහ 3 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා විසින් නිසි අධීක්ෂණ වගකීමකින් යුක්තව කටයුතු කර නොමැති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

01. මෙම සිද්ධිය සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකරුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

02. මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීමකින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් 3 වන වගඋත්තරකරුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2024. 12 . 27 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් :

01. අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - දැනගැනීම සඳහා

02. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා